"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary | දුරකථන / தொலைபேசி / Telephone - 2698409<br>ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667<br>ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk | | පොදු දුරකථන / தொலைபேசி / General Telephone | 2682868<br>2682869<br>2682870 |


| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. } CSO/ADM/18/38/05-2017 | ඔබේ අංකය. / உமது இல. / Your No. } | දිනය. / திகதி. / Date. } 2017.07. 18 |

**<u>පාලන චක්‍රලේඛ ලිපි : 01/2017</u>**

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),

සභා ලේකම් (බ.ප),

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/සැලසුම්/මුල්‍ය/ඉංජිනේරු),

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් (බ.ප.),

ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව-බ.ප.),

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිපි ඉදිරිපත් කිරීම.</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන විනය ගැටළු, හදිසි අනතුරු වන්දි ඉල්ලීම් ගැටළු විශ්ලේෂණය කිරීමේ දී විධිමත් ක්‍රමවේද අනුගමනය නොකිරීමත් ගැටළු වලට විසඳුම් ලබාදීමට අවශ්‍ය වන සියලු කරුණු ඉදිරිපත් නොවීමත් යන හේතු බලපා ඇති බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ලේකම්වරුන්ගේ රැස්වීමේ දී අවධානය යොමු කරන ලදී.

02. ඉහත හේතු නිසා ගැටළුවලට මුහුණ දුන් තැනැත්තාට ඒ සඳහා විසඳුමක් ලබා දීමට ගත වන කාලය අනවශ්‍ය පරිදි දීර්ඝ වන අතර කොමිෂන් සභාවට ද මෙවැනි ගැටළු වලට අනවශ්‍ය කාලයක් වැය කිරීමට සිදුවීම නිසා සම්පත් නාස්තියක් ද සිදු වේ.

03. ඒ අනුව, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ගැටළු ඉදිරිපත් කිරීමේ දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

i. නිලධාරීන් විධිමත් පරිදි නිවාඩු ලබා ගෙන නොමැතිව සේවයට නොපැමිණෙන අවස්ථාවල සේවය හැර යාමේ ලිපි නිකුත් කිරීම.
ii. නිලධාරීන් ඉදිරිපත් කරන අභියාචන සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් / අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කිරීම.
iii. අභියාචනා ප්‍රතික්ෂේප කරන්නේ නම් එය ලිඛිතව අදාල නිලධාරියාට දැනුම් දීම.
iv. විනය බලධාරියා විසින් විනය නියෝගය,හෝ අභියාචනයට අදාල තීරණ පමණක් ලබාදීම කළයුතුය.

v. විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2:12 යටතේ විශ්‍රාම ගැනීමට අයත් විනය පරීක්ෂණ කටයුතු කඩිනම් කර විනය තීරණ ලබා දීමට කටයුතු කිරීම.

vi. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 අනුව හදිසි අනතුරු වන්දි අයදුම්පත්‍ර වල සියලුම සත්‍ය ලේඛන ඉදිරිපත් කිරීම.

04. එසේම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ගැටලු අදාල අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය. මෙම ලිපියේ උපදෙස් පරිදි ඉදිරිපත් නොකරන ගැටළු සම්බන්ධව ඉදිරියේ කටයුතු සිදු නොකරන ලෙසත් එවැනි ඉල්ලීම් ආපසු ඔබ වෙත එවීමට ක්‍රියා කරන ලෙසත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත.

05. මෙම විධිවිධාන ඔබ යටතේ ඇති සියලු ආයතනයන් හි ප්‍රධානීන් වෙත දැනුම් දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

එම්.ඒ.බී.දයා සෙනරත්,<br>
ප්‍රධාන ලේකම්,<br>
බස්නාහිර පළාත.

<u>පිටපත්</u> : 01. ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.) - කාරු.දැ.ගැ.ස.<br>
02. ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරි - කාරු.දැ.ගැ.ස.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මූල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන / பணிப்பாளர் (உள்ளக கணக்காய்வு) / Director Internal Audit |
|---|---|---|---|---|---|---|
| | Tel: 2693964<br>Fax:2669479<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 2690058<br>Fax:2693952<br>dcspt@cs.wpc.gov.lk | Tel: 2693978<br>Fax:2679958<br>csfinance@wpc.gov.lk | Tel: 2693970<br>Fax:2676280<br>dsplancs@wpc.gov.lk | Tel: 2693968<br>Fax:2689899<br>dsengcs@wpc.gov.lk | Tel: 2689011<br>Fax:2689011 |